ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

මගේ අංකය: PS/PCA/11/PMT/5 වක්‍රලේඛ අංකය: PS/PCA/Circular/3/2022

2022 ඔක්තෝබර් 28 දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්

රාජ්‍ය අමාත්‍යාංශ විෂයයන් භාර සියළුම අතිරේක ලේකම්වරුන්

**2023 විසර්ජන පනත් කෙටුම්පත (අයවැය) පිළිබඳ විවාදය**

2023 අයවැය ලේඛණය මේ වන විට සකස් වෙමින් පවතින බැවින්, මුදල් අමාත්‍යාංශය, අදාළ අමාත්‍යාංශ, රාජ්‍ය අමාත්‍යාංශ, රාජ්‍ය ආයතන, පෞද්ගලික අංශය, විදේශ තානාපති සේවාවන් හා ජාත්‍යන්තර සංවර්ධන අරමුදල් ආයතන සමඟ තාක්ෂණික මට්ටමේ ඇගයීම් වල යෙදෙන බවත්, අයවැය සඳහා විශේෂ යෝජනාවන් හඳුනා ගැනීමත් සිදු කරන බැවින්, ඒ සඳහා සියළුම අමාත්‍යවරුන්, රාජ්‍ය අමාත්‍යවරුන්, අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා අදාළ නිළධාරීන්ගේ සෘජු දායකත්වය මුදල් අමාත්‍යාංශයට ලබා දිය යුතු බව ගරු ජනාධිපතිතුමා විසින් පෙන්වා දී ඇත. ඒ අනුව මේ පිළිබඳව ඔබ අමාත්‍යාංශයේ හා ගරු අමාත්‍යතුමන්ගේ යෝජනා හා අදහස් මේ වන විටත් මුදල් අමාත්‍යාංශය වෙත ලබා දී නොමැති නම් කඩිනමින් ඒවා ලබා දෙන ලෙස ප්‍රථමයෙන් දන්වනු කැමැත්තෙමි.

02. තවද, පාර්ලිමේන්තු කටයුතු කාරක සභාව විසින් අනුමත කර ඇති අයවැය කාල සටහන අනුව, 2022 නොවැම්බර් මස 14 වන දින ප.ව. 01.30ට පමණ ගරු ජනාධිපතිතුමා විසින් මුදල් අමාත්‍යවරයා වශයෙන් අයවැය කථාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිතය. දෙවැනිවර කියවීමේ විවාදය 2022 නොවැම්බර් මස 15 වෙනි අඟහරුවාදා දින පෙ.ව. 9.30 ට ආරම්භ කර, නොවැම්බර් මස 22 අඟහරුවාදා දින දක්වා පැවැත්වෙනු ඇත. අයවැය දෙවැනිවර කියවීම පිළිබඳ ඡන්ද විමසීම 2022 නොවැම්බර් මස 22 වන අඟහරුවාදා දින ප.ව. 5.00ට සිදු කිරීමට නියමිතය. අයවැය කාරක සභා විවාදය 2022 නොවැම්බර් මස 23 දින සිට 2022 දෙසැම්බර් මස 08 දින දක්වා පැවැත්වීමට නියමිත අතර විසර්ජන පනත් කෙටුම්පත තුන්වන වර කියවීමේ ඡන්ද විමසීම 2022 දෙසැම්බර් මස 08 දින ප.ව. 5.00ට පැවැත්වීමට නියමිතය. අයවැය විවාදය පිළිබඳ වැඩසටහනේ පිටපතක් ඔබගේ දැනගැනීම සඳහා මේ සමඟ අමුණා ඇත.

03. මෙම කාලය තුළ ගරු අමාත්‍යවරුන් හට නිල හෝ පෞද්ගලික විදේශ සංචාර සැලසුම් නොකළ යුතු අතර, විශේෂ අවස්ථාවන් සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාල හා තානාපති කාර්යාල හරහා අදාළ නියෝජනය ලබා දිය හැකි බව වැඩිදුරටත් සඳහන් කරනු කැමැත්තෙමි.

04. එබැවින්, අත්‍යාවශ්‍ය කටයුතු හැර වෙනත් විදේශ සංචාරවලට මෙම කාලය තුළ සහභාගී වීමෙන් වලකින ලෙස ගරු අමාත්‍යවරුන් හා ජ්‍යෙෂ්ඨ නිළධාරීන් දැනුම්වත් කිරීමට ද කටයුතු කරන්න.

ඊ එම් එස් බී ඒකනායක
ජනාධිපති ලේකම්

පිටපත් - 1. අග්‍රාමාත්‍ය ලේකම්
2. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
3. පාර්ලිමේන්තුවේ සභා නායක ලේකම්
4. පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක ලේකම්

} කරු.දැ.ගැ.පි.

ගාලු මුවදොර, කොළඹ 01 / காலி முகத்திடல், கொழும்பு 01 / Galle Face, Colombo 01
දුරකථන / தொலைபேசி / Telephones: ++ 94 (0) 11 2354418, ++ 94 (0) 11 2473873
ෆැක්ස් / தொலைநகல் / Fax: ++ 94 11 2446657
ඉ-තැපැල / மின்-அஞ்சல் / e-mail: prsec@presidentsoffice.lk

# 2023 - අයවැය විවාදය පිළිබඳ වැඩසටහන

2022 නොවැම්බර් 14 සඳුදා ප.ව. 1.30 - අයවැය කථාව
(විසර්ජන පනත් කෙටුම්පත දෙවැනිවර කියවීම)

**දෙවැනිවර කියවීමේ විවාදය**

2022 නොවැම්බර් 15 අඟහරුවාදා
16 බදාදා
17 බ්‍රහස්පතින්දා
18 සිකුරාදා
19 සෙනසුරාදා
21 සඳුදා
22 අඟහරුවාදා

වෙන් කළ දින ගණන හතකි (07)

විවාදය පැවැත්වෙන කාලය

පෙ.ව. 9.30 සිට ප.ව. 5.30 දක්වා

සභාව කල්තබන අවස්ථාවේ යෝජනාව

ප.ව. 5.30 සිට ප.ව. 6.00 දක්වා

*(නොවැම්බර් 22 අඟහරුවාදා හැර)*

*(වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න සහ සභාව කල්තබන අවස්ථාවේ ප්‍රශ්න නොමැත)*
*(දිවා ආහාර විවේකය සඳහා කාලය වෙන් කර නොමැත)*

**දෙවැනිවර කියවීමේ ඡන්ද විමසීම නොවැම්බර් මස 22 අඟහරුවාදා ප.ව. 5.00 ට සිදු කෙරේ.**

**කාරක සභා අවස්ථාවේ විවාදය**

2022 නොවැම්බර් 23 බදාදා
24 බ්‍රහස්පතින්දා
25 සිකුරාදා
26 සෙනසුරාදා
28 සඳුදා
29 අඟහරුවාදා
30 බදාදා
2022 දෙසැම්බර් 01 බ්‍රහස්පතින්දා
02 සිකුරාදා
03 සෙනසුරාදා
05 සඳුදා
06 අඟහරුවාදා
08 බ්‍රහස්පතින්දා

වෙන් කළ දින ගණන දහතුනකි (13)

විවාදය පැවැත්වෙන කාලය

පෙ.ව. 9.30 සිට ප.ව. 5.30 දක්වා

සභාව කල්තබන අවස්ථාවේ යෝජනාව

ප.ව. 5.30 සිට ප.ව. 6.00 දක්වා
*(දෙසැම්බර් 08 බ්‍රහස්පතින්දා හැර)*

*(වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න සහ සභාව කල්තබන අවස්ථාවේ ප්‍රශ්න නොමැත)*
*(දිවා ආහාර විවේකය සඳහා කාලය වෙන් කර නොමැත)*

**තුන්වැනිවර කියවීමේ ඡන්ද විමසීම දෙසැම්බර් මස 08 බ්‍රහස්පතින්දා ප.ව. 5.00 ට සිදු කෙරේ.**

ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක කාර්යාලය
පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

2022 ඔක්තෝබර් මස 27 වෙනි දින